# පිරිවෙන් අධ්‍යාපන සංවර්ධනය උදෙසා කෘත්‍යාධිකාරි භූමිකාව ක්‍රියාත්මක වියයුතු ආකාරය

**ප්‍රමුඛ මහාචාර්ය කනංගමුවේ රාහුල හිමි**

## හැඳින්වීම

පිරිවෙන් ආරම්භය බුදුන් වහන්සේ ධරමාන සමය තෙක් ඈතට දිව යන්නෙකි. මහාවග්ගපාලි, ධම්මපද, ජාතකපාලි, විනය අටුවාව, සමන්තපාසාදිකාව, පරමත්ථදීපනි ආදි ග්‍රන්ථයන්ගෙන් ඒ බව අනාවරණය කෙරේ. ශ්‍රී ලාංකේය පිරිවෙන් අධ්‍යාපනය ක්‍රි.පූ. 03 වැනි සියවස එනම් මහින්දාගමනයෙන් පසුව ආරම්භ වූවකි. ලක්දිව සම්බුද්ධ ශාසනය ප්‍රතිෂ්ඨාපනයත් සමග ආරම්භ වූ මෙම ආරාමික බෞද්ධ මධ්‍යස්ථාන වර්තමානය තෙක් දීර්ඝ කාලයක් පවත්වා ගෙන ඒමේ ගෞරවය හිමි විය යුත්තේ ලක්දිව භික්ෂූන් වහන්සේටය.

## පිරිවෙන් ශබ්දයාගේ අර්ථ නිරුක්තිය

පාලියෙහි 'පරිවෙණ' ශබ්දය එළු බසට බිඳී එනුයේ "පිරිවෙන්" යනුවෙනි. පදාවසානයෙහි "ණ" කාරය දන්තජව යෙදේ. එයට හේතුව ශබ්දාන්තයෙහි "ණ" කාරය ස්වර රහිතව නො යෙදෙන බැවිනි. නමුත් ඇතැම් ගුරු කුලයක් මූර්ධන්‍ය 'ණ' කාර සහිතව "පිරිවෙණ" යැයි භාවිත කෙරෙයි. මේ පිළිබඳව උගතුන් අතර විවිධ මතවාද පවතී.

"එළුයෙහි එන 'පිරිවෙන් ' සද පෙල බසෙහි 'පරිවෙණ' ශබ්දය ප්‍රභව කොට ඇත්තේයැ. සකු බසෙහි පරිවෙණ යන ව්‍යවහාරය අප්‍රකාශයැ. ශබ්ද ධර්මතා අනුව "පරිවෙණ" යි මූර්ධන්‍ය

"ණ" කාරවත් ශබ්දයෙක් වෙයි. එය සිය බසට බිඳී එනුයේ " පිරිවෙන්" යි දන්ත්‍ය "න" කාරවත්ව යැ. ශබ්දාන්තයෙහි ස්වර රහිතව "ණ" කාරය නො යෙදෙන හෙයිනි. ඒ වූ කලී ශබ්ද ධර්මතායි. එහි ස්වරවත් රූපය ''පිරිවෙන්'' යි සිටියැ යුතු වෙයි. එහෙත් විදුදය ගුරු කුලෙහි පඬිවරයෝ නැවැත මූර්ධන්‍යාදේශ කොට 'පිරිවෙණ' යයි ලියති. එහි සදසද්භාවය නිර්ණය කිරීමට ඡෙක ප්‍රයෝග විමසියැ යුතු වෙයි. (අනුරූ සේ පියෝනන්) මේ විමසන්න "විජයබා පිරුවන - කියන බණ මේ අසව් සතොසින" මෙහි පදාන්ත එළියෙහිලා "ණ" කාරය නො සිටුනේයැ. උච්චාරණයෙහි දී ශ්‍රැතියෙන් සමාන බවක් ඇසෙතත් ස්ථාන කරණාදි විසින් විභින්න වූ වර්ණ දෙකකි. මෙසේ හෙයින් පිරිවෙන් ආදි තැන්හි දන්ත්‍ය "න" කාරවත් පද රූපයම "සු" ශබ්ද සේ සලකන්නේ මැනවි"[1]

පිරිවෙන් යන පදයෙහි අර්ථය භික්ෂු නේවාසිකාගාර හා සමව ගැනේ. භික්ෂූන් වැඩ වාසය කරන ආවාස ගෙය, විහාර ගෙය යනු එහි සම අර්ථයයි. විහාර අංගණය මළුව අර්ථයෙන් ද ''පිරිවෙන'' ශබ්දය භාවිත වී ඇත.

"පවුරකින් වට කළ අංග සම්පූර්ණ විහාරස්ථානය, ලැගුම් ගෙයක් ඉදිරියෙහි තියෙන ශාලාව පිරිවෙන නම්."[2]

මෙම විග්‍රහයට අනුව පිරිවෙන් ශබ්දයාගේ අර්ථ දෙකක් ධ්වනිත කෙරෙයි. එනම් සියලු අංගයන්ගෙන් යුක්ත වූ විහාරස්ථානය හා ඒ ආශ්‍රිත පවත්නා වූ ශාලාව යනුයි. භික්ෂූන් වහන්සේලාගේ වාසස්ථානය බැවින් ද, නවක භික්ෂූන් වහන්සේ එම ගෘහයෙහිම ආචාර්ය, උපාධ්‍යාය හමුවෙහි අකුරු කරන බැවින් ද විහාරස්ථානය පිරිවෙන අර්ථයෙන් ගැනුනේ වනැයි අපගේ හැඟීමයි. භික්ෂූන් වහන්සේලාගේ වාසස්ථානය යන අදහසින් බුද්ධ කාලයේදී ''පිරිවෙන'' නම භාවිත වී ඇත. එහෙත් එහිදී භික්ෂූන් වහන්සේලාට අවශ්‍ය සියලු අධ්‍යාපන කටයුතු සිදුවිය. විරාගය පදනම් වූ ශ්‍රාවක භික්ෂූන්ගේ අධ්‍යාපන පිළිවෙත වූයේ ද නිවන් මාර්ගය අවබෝධ කර ගැනීමයි. ඒ සඳහා පූර්වකාලීන ආරාම සැකසෙන්නට ඇත. ඒ බව පහත උද්ධෘතයෙන් පැහැදිලි වේ.

"අද පිරිවෙන යනු විශේෂයෙන් පැවිදි අධ්‍යාපනය සඳහා වෙන් වූ එහෙත් ගිහියන්ටද ඉගෙනීමට බාධාවක් නැති ආරාමයක පිහිටුවා ඇති අධ්‍යයන කටයුතු සිදු කරන ආයතනයකි. එහෙත් ශාසන ඉතිහාසයේ මුල් අවධියේ 'පිරිවෙන' වචනය භාවිත වූයේ වැට පවුරු ආදියෙන් පරික්ෂේප වූ ආවාස ගෙයක් හෝ තනි තනිව පැවැති කුටි විශේෂයක් හැඳින්වීම සඳහාය. එයම පසුව ශාස්ත්‍රාභිලාෂී මහාසංඝයාගේ වාසය ද ඇතිව පඨන, පාඨන- උද්ග්‍රහණ, ධාරණ සජ්ඣායනා වාචන, ආචික්ඛන දේශනා, පටිපුච්ඡන, විවරණ, විභජන ක්‍රමයන්ගෙන් සංවිදිත අධ්‍යාපන කේන්ද්‍රස්ථාන බවට පරිවර්තනය විය."[3]

ධර්මය මුඛ පරම්පරාවෙන් ආරක්ෂා කර ගැනීමට අවශ්‍ය වූ ආකාරයෙන් නිර්මාපිත ගෘහය හා නිවන් පිණිස ධර්මය පරිශීලනය කිරීමට අවශ්‍ය වූ ගෘහය ''පිරිවෙන්'' නාමයෙන් හඳුන්වා ඇත. විවෙක භික්ෂූන්ගේ සමස්ත වාසස්ථානය යන අර්ථයෙන් ද ''පිරිවෙන්'' නාමය භාවිත විය.

"භගවතො පරිනිබ්බානෙ සබ්බෙ භික්ඛු අත්තනො අත්තනො පත්තචීවරං ගහෙත්වා විහාරෙච පරිවෙනෙච ඡඩ්ඩෙත්වා අගමංසු"[4]

භාග්‍යවතුන් වහන්සේගේ පරිනිර්වාණය ඇසූ සියලු භික්ෂූහු තම තමන්ගේ පාත්‍ර-චීවර රැගෙන විහාරයන්ගෙන් ද පිරිවෙන්වලින්ද නික්මුණහ යැයි විනය අටුවා සඳහන් කරයි. බුදුන් වහන්සේ ධරමාන සමයෙහි පවා භික්ෂූන්ගේ නේවාසිකා ගෘහය ''විහාර'' අර්ථයෙන්ද ''පිරිවෙන්'' අර්ථයෙන්ද හඳුන්වා ඇති බව එයින් පෙනේ. සමස්තයක් වශයෙන් ගත්කල ''පිරිවෙන්'' නාමය යොදා ඇත්තේ පැවිද්දන් විසූ ආරාමවලට බැව් නිසැකවම සඳහන් කළ හැකිය. ක්‍රමයෙන් එම ආරාමයන්ගෙන් බොහෝමයක් මහාසංඝයාගේ අධ්‍යාපන ආයතන බවට පරිවර්තනය විය. විශාල සංඝාවාස මෙන්ම එක් තෙර නමකගේ කාමර ගෘහයකට ද "පිරිවෙන්'' නාමය යොදා ඇත. අබයරත්න අදිකාරි මහතා අනුත්තානත්ථදීපනී පාඨයකින් ඒ බව මෙසේ අනාවරණය කරයි.

"අනතුරුව ආචරිය උපජ්ඣාය හිමිවරුන්ගේ කුටිද, සෙසු

භික්ෂූන්ගේ පුද්ගලික සෙනසුන්ද පිරිවෙන වශයෙන් දක්වා ඇති බව අනුත්තානපදදීපනියෙහි ''අත්තනො පරිවෙණන්ති ඉමිනාපි තස්සෙව පුග්ගලික සෙනාසනං වුත්තං අත්තනො පරිවෙණන්ති ඉමිනා ආචරියුපජ්ඣාය වසනට්ඨානං දසසිතං''[5]

නිර්වාණගාමී වූ භික්ෂු අධ්‍යාපනය මුල දී විදර්ශනාව මුල්කොට ගත්තක් වුවද කල් යත්ම විවිධ විෂයයන් හා භාෂා ශාස්ත්‍ර ඥානයක් ලබා ගත යුතු අධ්‍යයන ක්ෂේත්‍රයක් විය. එය ධර්ම විනය විෂයයෙන් පරිබාහිර වූ තරමටම බුද්ධ කාලයෙන් පසුව දඹදිව ඇති වූ පිරිවෙන් විශ්වවිද්‍යාල තත්වයෙන් ක්‍රියාත්මක විය.

## යුරෝපීය ආධිපත්‍යය හා වර්තමාන ශ්‍රී ලාංකේය පිරිවෙන් අධ්‍යාපනයෙහි ආරම්භය

කෝට්ටේ යුගයේ අවසාන භාගයේ දි ශ්‍රී ලංකාව යුරෝපීය ජාතීන්ගේ ග්‍රහණයට ගොදුරු විය. ක්‍රි.ව 1505 දී[6] පෘතුග්‍රීසින් මුලින්ම ලංකාව ආක්‍රමණය කළේය. ඉන්පසුව ක්‍රමයෙන් ලන්දේසින් ද (1658)[7] ඉන් අනතුරුව ඉංග්‍රීසින් ද (1796)[8] මෙරට ආක්‍රමණය කළේ ය. ඔවුනගේ බලාපොරොත්තුව වූයේ ශ්‍රී ලංකාව සම්පූර්ණයෙන් යටත් කොට තම වෙළඳ ව්‍යාපාර කටයුතු පවත්වාගෙන යාමයි. එසේම මිෂනාරි අධ්‍යාපනය ආරම්භ කරමින් ආගමික යුද්ධයක් මෙරට ව්‍යාප්ත කරවීමයි. මේ යුගයන්හිදි විදේශීය ජාතීන්ගේ ආගම් ව්‍යාපාරය නිසා වෙහෙර විහාර විනාශ වී ගියේය. පංසල, පිරිවෙන කේන්ද්‍ර කොට ගත් අධ්‍යාපනය සහමුලින්ම විනාශ විය. එකදු උපසම්පදා භික්ෂුවක් හෝ සොයා ගැනීමට නොහැකි විය. විශේෂයෙන්ම වර්තමාන පිරිවෙන් අධ්‍යාපනය ආරම්භ වීම සෙංකඩගල රාජධානි සමය සීමා මායිම් වශයෙන් සැලකේ. ඒ අසරණ සරණ වැලිවිට ශ්‍රී සරණංකර සංඝරාජ මා හිමිපාණන් වහන්සේ ගේ උත්සාහයේ ප්‍රතිඵලයක් වශයෙනි.

සංඝරාජ හිමියන් සිල්වත් සමාගම හරහා රටෙහි විවිධ ප්‍රදේශයන්හි අධ්‍යාපන කටයුතු ආරම්භ කරන ලදි. එපමණක් ද නොව විනාශ වී ගිය වෙහෙර විහාර ප්‍රතිසංස්කරණය කරවමින්

ඒ ඒ තැන පිරිවෙන් ද ආරම්භ කරන ලදි. පළමුවෙන්ම මෙම විද්‍යාස්ථානවලින් සිදු වූයේ භික්ෂු චරියාව සැකසීමයි. ඉන් අනතුරුව විවිධ විෂය ක්ෂේත්‍රයන් කෙරෙහි තත් අධ්‍යාපනය ව්‍යාප්ත කරවීය. උන් වහන්සේගෙන් ඇරඹී නූතන පිරිවෙන් අධ්‍යාපනයෙහිලා වඩාත් ඵලදායි වශයෙන් වර්තමාන පිරිවෙන් අධ්‍යාපනය කෙරෙහි දායක වූවෝ හික්කඩුවේ ශ්‍රී සුමංගල නාහිමිපාණන් වහන්සේ හා රත්මලානේ ශ්‍රී ධර්මාලෝක තෙරවරු ය. වර්ෂ 1873 දි මාලිගාකන්ද විද්‍යෝදය පිරිවෙන ආරම්භ කිරීමත්, වර්ෂ 1875 දි පෑලියගොඩ විද්‍යාලංකාර පිරිවෙන ආරම්භ කිරීමත් වර්තමාන පිරිවෙන් අධ්‍යාපනයෙහි නොමැකෙන සන්ධිස්ථානයක් වශයෙන් හැඳින්වීමට පුළුවන. රත්මලානේ පරමධම්මචේතිය පිරිවෙන්පති වළානේ ශ්‍රී සිද්ධාර්ථ මහාපඬිවරයාණන් වහන්සේගේ පූර්ව අනුමැතිය හා අධීක්ෂණය යටතේ ශිල්ප ග්‍රහණය කළ සුමංගල හිමියන් හා ධර්මාලෝක හිමියන් ඇරඹී අධ්‍යාපනික ආයතන වනාහි වැලිවිට ශ්‍රී සරණංකර සංඝරාජ හිමියන්ගේ අප්‍රතිහත ධෛර්යයෙහි උත්කෘෂ්ඨ ප්‍රතිඵලයකි. විද්‍යෝදය හා විද්‍යාලංකාර පිරිවෙන් ආශ්‍රය කරගෙන අධ්‍යාපනය හැදෑරූ ගිහි-පැවිදි බොහෝ උගත්හු රටෙහි ඒ ඒ තැන පිරිවෙන් විද්‍යාස්ථාන ආරම්භ කරමින් පිරිවෙන් අධ්‍යාපනයෙහි ව්‍යාප්තිය උදෙසා විශාල සේවාවක් සිදු කළහ.

පිරිවෙන් අධ්‍යාපනය ලංකාවේ සෑම පළාතකම එලෙස ස්ථාපිත වීමත් සමග එහි වඩාත් ක්‍රමවත් බවක් හා ඵලදායි බවක් අපේක්ෂාවෙන් 20 වැනි සියවසෙහි මුල් කාර්තුවේ දී ශ්‍රී ලංකා ප්‍රාචීන භාෂෝපකාර සමාගම ආරම්භ කරන ලදි.

"1902 වර්ෂයේ ලංකාවේ අධ්‍යාපන අධ්‍යක්ෂකවරයා වූ එස්. එම් බාරෝස් මහත්මා විසින් එම අවධියෙහි සිටි ගිහි ප්‍රාචීන පඬිවරයන්ගේ සහාය ලබාගෙන ලක් රජයේ ද අනුග්‍රහය ඇතිව කොළඹ ප්‍රාචීන භාෂෝපකාර සමාගම ආරම්භ කරන ලදි"[9]

ප්‍රාචීන භාෂෝපකාර සමාගම ශ්‍රී ලංකා අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ ද සහයෝගය ඇතිව ප්‍රාචීන විභාග ක්‍රමය

ආරම්භ කරන ලදි. නිර්වාණගාමී ප්‍රතිපදාවට පමණක් සීමා නොවුණු නූතන පිරිවෙන් අධ්‍යාපනය වර්තමාන සමාජය අපේක්ෂිත අරමුණු හා පරමාර්ථ සාධනයෙහිලාද දායකත්වය සපයන්නට පෙළඹුනේ වන. රටක අධ්‍යාපනය සමාජ පරිවර්තනයත් සමග වෙනස්කම්වලට පරිවර්තනය වීම නො වැළැක්විය හැක්කකි. ඒ අනුව 20 වැනි සියවසේදීම සමාජගත වූ "ලෝකය විශ්ව ගම්මානයකි" යන තේමාවට උචිත පරිදි ශ්‍රී ලාංකේය අධ්‍යාපන ක්‍රමය සැකසෙන්නට වන. එකම රටක අධ්‍යාපන ප්‍රතිපත්තියෙහි දෙමගක ක්‍රියාකාරකමක් දක්නට නැත. ඒ අනුව පිරිවෙන් අධ්‍යාපනයද ක්‍රමයෙන් නූතන ලෝකය ජය ගත හැකි අධ්‍යාපන ක්‍රමවේද භාවිතයට පෙළඹිණ. ලක්දිව ථෙරවාදි භික්ෂූන් වහන්සේට ආවේණික බුද්ධ ධර්මය ප්‍රමුඛ කොට ඇති ප්‍රාචීන භාෂා ශාස්ත්‍ර අධ්‍යනය බැහැර කොට නවීන විවිධ විෂයන් හා භාෂා අධ්‍යයන පමණක් පිරිවෙන් අධ්‍යාපනය තුළින් ප්‍රචලිත වූයේ යැයි යන මතය බැහැර කළ යුතු ය. අද ද පිරිවෙන් අධ්‍යාපනයේ මූලික තේමාව ථෙරවාදි බුදු දහම ඉගෙන ගැනීම හා ඉගැන්වීමයි.

19 වන සියවසේ මැද භාගයේ දි පමණ පත් කළ අධ්‍යාපන කොමිෂන් සභාව, රාජකීය ආසියාතික සමිතියේ ලංකා ශාඛාව, පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව, ආදි ආයතනයන්ගෙන් පිරිවෙන් අධ්‍යාපනයේ යම් යම් ප්‍රවර්ධනයන් සඳහා වූ දායකත්වය මෙහි දි අමතක කළ යුතු නොවේ. අඩසියවසක් පමණ පුරාවට මෙරට පැවැති ආගමික වාද-විවාද චක්‍රාකාරයෙන් නමුත් පිරිවෙන් අධ්‍යාපනයේ ප්‍රගමණයටම හේතු විය. එසේම 19 වන සියවසයේ දි රජයේ මැදිහත් වීමෙන් පිරිවෙන්වලට මූල්‍යමය ආධාර සපයන්නට ද විය.

"1878 වර්ෂයේ දි, එනම් පිරිවෙන් ආරම්භ කොට වසර පහකින් විද්‍යෝදය පිරිවෙනට රුපියල් 600 ක වාර්ෂික ආධාරයක් ගෙවා ඇති බව පාලන වාර්තාවේ සඳහන් වේ. පිරිවෙනක් සඳහා එක එල්ලේම වාර්ෂික ආධාරයක් ගෙවන ලද මුල්ම අවස්ථාව මෙය වන්නේ ය."[10]

වර්තමාන පිරිවෙන් අධ්‍යාපනයේ ඇති වූ ගැටලු හා ඒවාට විසඳුම් ඉදිරිපත් කිරීම සඳහා විටින් විට කමිටු පත් කිරීමට රජයට

සිදු විය. වර්ෂ 1959 හිදි අංක 11828 දරන පිරිවෙන් නියෝග සංග්‍රහ, 1957 අංක 45 දරන විද්‍යෝදය විද්‍යාලංකාර විශ්වවිද්‍යාල පනත, 1967 අංක 4 දරන අධ්‍යාපන අමාත්‍යංශ චක්‍රලේඛය, 1970 හි පිහිටුවන ලද "පිරිවෙන් අධ්‍යාපනය ස්ථාවර කිරීම හා පිරිවෙන් අධ්‍යාපන විශේෂ කමිටුව, 1979 අංක 6 දරන පිරිවෙන් ආඥා පනත, 1980 අංක 01 දරන පිරිවෙන් නියෝග මාලාව ඒ අතර විශේෂිත වේ. මේ සියලු පනත් මගින් සිදු වූයේ පිරිවෙන් අධ්‍යාපනය ස්ථාවර කිරීම හා පිරිවෙන් අධ්‍යාපනය ඵලදායි ලෙස රටේ සංවර්ධන ක්‍රියා දාමයට අනුගත කිරීමය. වර්ෂ 1959 අංක 11828 දරන පනතින් පිරිවෙන් සඳහා වූ ගුරු වැටුප් නියම කිරීම හා විවිධ ආධාර පිළිබඳ නිර්දේශ සම්මත කෙරිණ. නමුත් එම වැටුප් ක්‍රමයද ආධාර ක්‍රමය යටතේම විග්‍රහ වී ඇත. පිරිවෙන් ගුරු භවතාගේ වැටුප් හා වෙනත් කාර්යයන්හි වැඩි ස්ථාවරත්වයක් සිදු වූ පනත් වශයෙන් ගැනෙන්නේ 1979 අංක 64 දරන පිරිවෙන් අධ්‍යාපන පනත හා 1980 අංක 01 දරන පිරිවෙන් නියෝග සංග්‍රහයෙනි. පිරිවෙන් අධ්‍යාපනය කෙරෙහි එතෙක් පැවති ප්‍රධාන දුර්වලතා මගහරවාලමින් සම්මත තත් පනත්වලින් එතෙක් පැවති පිරිවෙන් ව්‍යූහයද වෙනස් කෙරිණ. කනිෂ්ඨ, ජ්‍යෙෂ්ඨ හා විශ්වවිද්‍යාල අනුබද්ධිත පිරිවෙන් ආයතන වශයෙන් සැකසී තිබූ පිරිවෙන් ව්‍යූහය මූලික පිරිවෙන, මහ පිරිවෙන හා පිරිවෙන් විද්‍යායතන නමින් වර්ගීකරණය කරන ලද්දේද 1980 අංක 01 දරන පිරිවෙන් නියෝග සංග්‍රහයෙනි. කාලයෙන් කාලයට ව්‍යවස්ථා හා අතුරු ව්‍යවස්ථා මගින් ශ්‍රී ලාංකේය පිරිවෙන් අධ්‍යාපනයෙහි සුරක්ෂිතතාව වෙනුවෙන් එවකට රජය හා පිරිවෙන් මණ්ඩල ක්‍රියා කොට ඇත. රජය ඍජුව මැදිහත්වීම මෙන්ම ගිහි-පැවිදි විශාල පිරිසකගේ උනන්දුවත් තත්කාලීන පිරිවෙන් ආචාර්යවරයන්ගේ දැඩි උනන්දුවත්, කැපවීමත් මත පිරිවෙන් අධ්‍යාපනයේ ප්‍රගමනය ක්‍රමයෙන් සිද්ධ විය.

## පිරිවෙන් පරිපාලන භූමිකාව

පිරිවෙන් පරිපාලනය පිළිබඳව ද රජය විසින් විටින් විට විවිධ අණ පනත් හා කෙටුම්පත් ඉදිරිපත් කර ඇත. ඒ අතර 1959 වර්ෂයෙහි ක්‍රියාත්මක කළ ආඥාපනත අනුව ප්‍රධාන නිලධාරි තුන්දෙනෙකු පිරිවෙන් පරිපාලනය කෙරෙහි නම් කෙරිණ. ඒ කෘත්‍යාධිකාරි, අධ්‍යාපන අධ්‍යක්ෂ ජෙනරාල්වරයා හා පරිවෙණාධිපති වශයෙනි. පනතට අනුව අධ්‍යාපන අධ්‍යක්ෂවරයාගේ එකම පත් කිරීම කෘත්‍යාධිකාරි තනතුරයි. 1959 පනතට අනුව කෘත්‍යාධිකාරි හා පරිවෙණාධිපති තනතුර එකම අයෙකුට දැරීමට හැකියාව තිබුනත් 1979 හා 1980 පනත් අනුව ඒ තනතුරු දෙකට දෙදෙනෙකු පත්කළ යුතු විය.

## කෘත්‍යාධිකාරි

අධ්‍යාපන අධ්‍යක්ෂවරයා විසින් පත් කරනු ලබන කෘත්‍යාධිකාරි පිරිවෙනක පරිපාලන ව්‍යුහයේ සියලු කටයුතු හා නඩත්තු පිළිබඳව වගකියන ප්‍රධාන නිලධාරියායි. නමුත් වැටුප් රහිත පත්වීමකි. ''ජනරජය යටතේ යම් වැටුප් ලබන තනතුරක් දරන භික්ෂූන් වහන්සේ නමක් පිරිවෙනක කෘත්‍යාධිකාරින් වහන්සේ වශයෙන් පත් කරනු නො ලැබිය යුතුය.''11 (1979 ආඥාපනත) කෘත්‍යාධිකාරි වහන්සේ නමක් තෝරා ගතයුතු ආකාරය ද එම ආඥා පනතේ සඳහන්ය. පිරිවෙන පිහිටි ස්ථානයේ අධිපති හෝ ඔප්පුවකින් ස්ථානය භාර කළ අයෙකු, එසේ අයෙකු නැත්නම් පරිවෙණාධිපති හා කෘත්‍යාධිකරි තනතුරු දෙකම එක් අයෙකුට භාරදීම කළ හැකිය. එසේත් කළ නො හැකි කල්හි පිරිවෙන් පාලක සභාවේ පෙනී සිටින සුදුසුම භික්ෂූන් වහන්සේ නමක් පත් කිරීම කළ හැකිය. වර්තමානයේ බොහෝ කොට පවතින ක්‍රමය වන්නේ ශිෂ්‍යානු ශිෂ්‍ය පරම්පරාවේ ධූරාවලිය අනුව කෘත්‍යාධිකාරි තනතුර පිරිනැමීමයි. පිරිවෙනක භෞතික සම්පත්, අධ්‍යාපන හා පිරිවෙන් විනය පවත්වා ගැනීම, සෞඛ්‍ය සුරක්ෂිත කරවීම හා ආචාර්ය මණ්ඩලය නිසියානුකූලව සේවයේ යෙදවීම හා රාජ්‍ය චක්‍රලේඛ ක්‍රියාත්මක කරවීම කෘත්‍යාධිකාරි හිමියන්ගේ ප්‍රධාන රාජකාරි වේ.

වර්තමාන පිරිවෙන් අධ්‍යාපන ක්ෂේත්‍රය තුළ කෘත්‍යාධිකාරි භූමිකාව ක්‍රියාත්මක වීමේ දි යම් යම් අකටයුතුකම් සිදුවන බව ඇතැම් පරිවේණාධිපතීන් වහන්සේලාගේ අදහසයි. පිරිවෙනක ගුරුවරයෙකු අනුමත කිරීම, පත් වීමෙන් නෙරපීම කෘත්‍යාධිකාරිගේ ප්‍රසාදය මත සිදුවන බැවින් කෘත්‍යාධිකාරි තනතුර ඒකාධිපති ස්වරූපයක් ගන්නේ යැයි ඇතමෙක් ප්‍රකාශ කරති. පත්වීම් අනුමත කිරීමේ දී ද අධ්‍යාපන සුදුසුකම් මත පදනම් නොවුණු ආත්මීය ලක්ෂණ පදනම් කරගත් ක්‍රමයක් අනුගමනය කරති. විටෙක ගිහි ඥාතිත්වය මතද විටෙක වෙනත් හිතවත්කම් මත ද පත්වීම් අනුමත කිරීමට ඔවුහු උත්සාහ දරති. එහි ප්‍රතිඵලය අනිසි ලෙස බලපානු ලබන්නේ අධ්‍යාපනය ලබන ශිෂ්‍ය ප්‍රජාවටයි. වර්තමාන ඇතැම් කෘත්‍යාධිකාරි හිමිවරු පිරිවන් ගුරුවරුන් කෙරෙහි අනිසි බලපෑම් සිදු කරන බවක් ද දක්නට ලැබේ. නීතිමය සීමාවක් ඉක්මවා යන බලපෑම් මත එම ගුරුවරුන්ගේ පත්වීමේ අස්ථාවර භාවයද, චිත්ත වික්ෂෝපයද නිසා ගුරු කර්තව්‍ය නිවැරදිව හා නිසියාකාරව සිදු කිරීමට නොහැකි තත්ත්වයක් උද්ගත වී ඇත. සමහර කෘත්‍යාධිකාරි හිමිවරුන් පිරිවෙන් විනය, භෞතික සම්පත් කළමනාකරණය හා ගුරු කාර්යයන් පිළිබඳ සොයා බැලීම් ආදි කිසිවක් නො කරන බවද පෙනේ. වර්ෂාවසානයේ ලැබෙන පිරිවෙන් නඩත්තු ගෙවීම තම අවශ්‍යතා උදෙසා වියදම් කරන කෘත්‍යාධිකාරි හිමිවරුන් ද නැත්තේ නොවේ.

පිරිවෙනකට ගුරුවරයෙකු බඳවා ගැනීමේදි නිසි බලධරයා වශයෙන් ක්‍රියා කරන්නේ කෘත්‍යාධිකාරි හිමිය. පත්වීම් අනුමත කිරීම රජයෙන් සිදු වුවද ඒ සඳහා නිර්දේශ කරනු ලබන්නේ කෘත්‍යාධිකාරිය. නමුත් රජයේ පත්වීම්වල එවැනි නිර්දේශ කිරීමක් වෙනත් ආයතනයක සංස්ථාවක දක්නට නො ලැබේ. එවැනි ක්‍රමයක් පිරිවෙන් තුළ ක්‍රියාත්මක කරවීමෙන් පිරිවෙන් ගුරුවරයාගේ පත්වීමේ සුරක්ෂිත භාවය තහවුරු කෙරේ. එසේ ම කෘත්‍යාධිකාරි හිමියන්ගේ ඒකාධිපතිත්වය විමධ්‍යගත වීමක්ද වේ. පිරිවෙන් පත්වීම් රජයේ නිශ්චිත ලේකම්වරයෙකු යටතේ සිදු කිරීම වඩාත් ඵලදායි වනු ඇත.

1. පිරිවෙන් පාලක සභා ව්‍යුහය

පිරිවෙන් කෘත්‍යාධිකාරින් වහන්සේ සභාපති විය යුතුය.

පරිවේණාධිපතින් වහන්සේ එහි ලේකම්වරයා විය යුතුය.

පිරිවෙන් ආචාර්ය මණ්ඩලයෙහි නියෝජිතයන් දෙදෙනෙකු

පිරිවෙන් සංවර්ධන සභාවේ නියෝජිතයන් දෙදෙනෙකු

පිරිවෙන් ආදි ශිෂ්‍යයන් නියෝජනය කරමින් දෙදෙනෙකු

මෙවැනි සාමාජිකයන්ගෙන් සැදුම්ලත් පිරිවෙන් පාලක සභාවක් මේ වනවිට කිනම් පිරිවෙනක ක්‍රියාත්මක වන්නේදැයි සැක සහිතය. මෙම පාලක සභාවේ සභාපති කෘත්‍යාධිකාරි හිමියන් බැවින් එවැනි සභාවක් සක්‍රියව පවත්වාගෙන යාමේ වගකීම කෘත්‍යාධිකාරි හිමියන්ගේ ප්‍රධාන වගකීමක් වේ. එසේම පිරිවෙන් සංවර්ධන අරමුදලක් පවත්වාගෙන යායුතුය. ඒ සඳහා පිරිවෙනට සම්බන්ධ සියලු පාර්ශ්වයන් සම්බන්ධ පිරිවෙන් සංවර්ධන සභා අරමුදල නමින් සංගමයක් පිහිටුවාගත යුතුය. එහි සභාපතිවරයා විය යුත්තේ ද කෘත්‍යාධිකාරි හිමියන්ය. නමුත් මෙවැනි පාලක සභාවක්වත්, සංවර්ධන අරමුදල නමින් යුත් සංගමයක්වත් අද බොහෝ පිරිවෙන්වල පවත්වන්නේ නැත. එය කෘත්‍යාධිකාරි හිමියන්ගේ කාර්‍ය්‍ය පැහැර හැරීමක් සේ හඳුනාගත හැකිය.

පිරිවෙනක කෘත්‍යාධිකාරි තනතුරක් ඇති කිරීමෙන් බලාපොරොත්තු වූයේ පිරිවෙන් නේවාසික ශිෂ්‍ය භික්ෂූන් වහන්සේලාගේ ආගමික, ශාසනික සම්ප්‍රදායන්වලට ශිෂ්‍ය භික්ෂූන් හුරුකරවීමයි. වර්තමාන පිරිවෙන් අධ්‍යාපන ක්‍රමය නූතන සමාජය හා සමාන්තර වීමේ අනිසි ප්‍රතිඵලයක් වූයේ ශාසනික සම්ප්‍රදායන් තදනුගත පාඨමාලා ව්‍යුහය තුළ ක්‍රියාත්මක නොවීමයි. තත් ශාසනික සම්ප්‍රදාය ශිෂ්‍ය භික්ෂූන් වහන්සේලාට හුරුකරවීමේ භාරදූර වගකීම පැවරෙන්නේ කෘත්‍යාධිකාරි හිමියන්ටය. සද්ධි විහාරික ශිෂ්‍ය භික්ෂූන්ගේ තත් හික්මවීම උපාධ්‍යායන් වහන්සේ විසින් දැරිය යුතුය. වර්තමාන පිරිවෙන් අධ්‍යාපයනයෙහි උපාධ්‍යායයන්

යනුවෙන් චරිතයක් හමුවන්නේ නැත. ශාසනික සාම්ප්‍රදාය තුළ හමුවන උපාධ්‍යායන් වහන්සේලාගෙන්ද ත්‍රිපිටකානුගත තත් උපාධ්‍යාය මත ඉටුවන්නේ නැත. තනතුරු නාම ලාභයක් සේ සලකා උපාධ්‍යායයන් වහන්සේලා ද බහුමානයෙන් යුක්තව විහාරස්ථානවල වැඩ වසති.

චුල්ලවග්ගපාලියේ වත්තක්ඛන්ධකයේ උපාධ්‍යායයන් වහන්සේ විසින් සද්ධි විහාරිකයන් වෙනුවෙන් දැක්විය යුතු පිළිවෙළක් දක්වා ඇත.

"උපජ්ඣායෙන භික්ඛවෙ සද්ධිවිහාරිකම්හි සම්මා වත්තිතබ්බං තත්‍රායං සම්මා වත්තනා..........

උපජ්ඣායෙන භික්ඛවෙ සද්ධිවිහාරිකො සංගහෙ තබ්බො අනුග්ගහෙතබ්බො උද්දෙසන පරිපුච්ඡාය ඔවාදෙන අනුසාසනියා........"[12]

උපාධ්‍යායන් විසින් සද්ධි විහරිකයා කෙරෙහි උදෙසීමෙන් (පෙළදහම් කියවීමෙන්) නැවත නැවත විචාරීමෙන් අවවාදයෙන් අනුසාසනයෙන් සංග්‍රහ කළ යුතුයැයි ආදියෙන් පටන් ගෙන ගිලන්වත, පැන් වත, ශික්ෂා වත, පිණ්ඩපාත වත, පාත්‍ර වත, චීවර වත ආදී වතාවත්වල නිරතවිය යුතු ආකාරය පුරුදු පුහුණු කළ යුතුය. එසේම ධර්මය පිළිබඳ ඉගැන්විය යුතුය. ධර්මය පිළිබඳ කුකුස් නැති කළ යුතුය. සද්ධි විහාරිකයා ඇවැතකට පත්වූයේ නම් මානත හෝ අබ්භාහනය සඳහා යොමු කළ යුතුය.

දෛනික ජීවිතයේ ප්‍රගුණ කළ යුතු සියලු ශාසනික වත උපාධ්‍යායන් වහන්සේ විසින් සද්ධි විහාරිකයන් වෙත දැක්වීමෙන් අනුග්‍රහ කිරීමෙන් පිරිවෙන්වාසී සද්ධි විහාරික ශිෂ්‍ය භික්ෂූන් වහන්සේ තත් ශාසනික සම්ප්‍රදායන්ට හුරු වන්නේය. වර්තමාන භික්ෂූන් වහන්සේ උපාධ්‍යායන් වහන්සේගේ තත්ත්වය වෙනත් ආකාරයකට නැඹුරු වී ඇති බැවින් වත්තක්ඛන්ධකයේ කීවාවූ තත් ශාසනික වත පිරිවෙන්වාසී ශිෂ්‍ය භික්ෂූන්ට ප්‍රගුණ කරවීම පිණිස කෘත්‍යාධිකාරි නමින් තනතුරක් පිරිවෙන් සම්ප්‍රදායට එකතු විය. වර්තමාන පිරිවෙන් අධ්‍යාපනයේ උපාධ්‍යායන් විසින් සද්ධි විහාරිකයා වෙත දැක්විය යුතු මාර්ගෝපදේශකත්වය ඉටුකිරීමෙහි

මූලිකයා වන්නේ කෘත්‍යාධිකාරි හිමියන්ය. නමුත් වර්තමාන පිරිවෙන් අධ්‍යාපනයේ දි කෘත්‍යාධිකාරි භූමිකාවෙන් මේ කර්තව්‍යයන් බලාපොරොත්තු වීම හරසුන් පැතුමක් වී හමාරය. ආරාම හා ශාසනික වත් කළමනාකරණය නිවැරදිව නිසියාකාරයකින් ඉටුකරන කෘත්‍යාධිකාරි හිමිනමක් වේ නම් ඒ ඉතාම සීමිතය. 752 වූ වර්තමාන පිරිවෙන් සංඛ්‍යාවෙන් 25% ක පමණ පිරිවෙන් සංඛ්‍යාවක කෘත්‍යාධිකාරි හිමියන්ගෙන් තත් උපාධ්‍යායන් වහන්සේගේ භූමිකාව නිසියාකාරව ඉටු කෙරෙන බව සිහිපත් කරන්නේ උන්වහන්සේලාට ගෞරවයක් වශයෙනි. උපාධ්‍යායන් වහන්සේගේ කාර්‍ය්‍ය හා කර්තව්‍යය කෘත්‍යාධිකාරි හිමිට අන පනත් මගින් පැවරෙන්නක් නොව වගකීමක් වශයෙන් දැරිය යුතු වගවීමකි.

1979 අංක 64 දරන පිරිවෙන් අධ්‍යාපන පනතින් කෘත්‍යාධිකාරි හිමියන්ගේ කාර්‍ය්‍යභාරය හා බලතල කවරේදැයි විග්‍රහ කොට ඇත.

(අ) අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් පිරිවෙන සඳහා නියම කරනු ලබන සුදුසු හා ප්‍රමාණවත් ඉඩ පහසුකම්, ගෘහභාණ්ඩ උපකරණ, සනීපාරක්ෂක සහ වෙනත් පහසුකම් සැලසීම:

(ආ) නියම කරනු ලබන අධ්‍යාපන හා සංස්කෘතික තත්වයක් පිරිවෙනෙහි පවත්වාගෙන යාම:

(ඇ) මණ්ඩලයේ අනුමතයට යටත්ව, පිරිවෙනෙහි පරිවේණාධිපතීන් වහන්සේ හා ආචාර්යවරුන් පත් කිරීම සහ ඔවුන්ගේ සේවය නතර කිරීම:

(ඈ) පිරිවෙන වෙනුවෙන් රජයේ අරමුදලින් ගෙවනු ලබන ආධාර මුදල් පිරිවෙනේ උපරිම යහපත සඳහා යෙදවීම:

(ඉ) පිරිවෙනේ ආචාර්ය මණ්ඩලය වෙත පවරනු ලැබ ඇති කර්තව්‍ය හා කාර්ය ඒ ආචාර්ය මණ්ඩලය විසින් ඉටු කරනු ලබන බවට හා කලින් කල අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් නිකුත් කරනු ලබන

උපදෙස්වලට අනුකූලව ඒ ආචාර්ය මණ්ඩලය ක්‍රියා කරන බවට වග බලා ගැනීම: සහ

(ඊ) රෝගාතුර වීම නිසා හෝ ශ්‍රී ලංකාවෙන් බැහැරව සිටීම නිසා හෝ වෙනත් යම් කරුණක් නිසා හො යම් කාර්ය ඉටු කිරීමට කෘත්‍යාධිකාරීන් වහන්සේට වන අවස්ථාවක, කෘත්‍යාධිකාරී වශයෙන් කටයුතු කිරීම සඳහා සුදුසු යැයි මණ්ඩලයට සහ අධ්‍යක්ෂ ජනරාල්වරයාට පිළිගත හැකි තැනැත්තෙකු නිර්දේශ කිරීම:

යනාදිය දැක්විය හැකිය. එසේම කෘත්‍යාධිකාරි හිමියන් වෙත පැවරෙන වෙනත් කටයුතු පහත පරිදි විග්‍රහ කොට බෙදා දැක්වීමට පුළුවන.

I. අමාත්‍යංශ මට්ටමින් කැඳවනු ලබන ප්‍රාදේශීය හෝ ජාතික රැස්වීම්වලට සහභාගි වීම හා නායකත්වය ලබාදීම.

II. පිරිවෙනේ මාසික ආචාර්ය මණ්ඩල රැස්වීමට අනුශාසකත්වයෙන් සහභාගි වීම.

III. පිරිවෙනේ දෛනික සියලුම වතාවත්වල දී ආදර්ශමත් නායකත්වය සැපයීම.

IV. කාලය කළමනාකරණය කරමින් පිරිවෙනේ වැඩි කාලයක් රැඳී සිටීම.

V. ආරාම කළමනාකරණය.

VI. ප්‍රත්‍ය පහසුකම් සැපයීම හා පරිසරය සංරක්ෂණයට ශිෂ්‍යයන් යොමු කරමින් සැලසුම් සාදා ක්‍රියාත්මක කිරීම.

කෘත්‍යාධිකාරි භූමිකාවෙන් මේ සියලු කාර්‍ය්‍ය හා කර්තව්‍යයන් ඉටුකරමින් පිරිවෙන් අධ්‍යාපනය සංවර්ධනය සඳහා දායක විය යුතුය. නමුත් රටේ හා ශාසනික සම්ප්‍රදායයේ අවාසනාවකට මෙන් බොහෝ පිරිවෙන්වල කාත්‍යාධිකාරී හිමියන් නාමමාත්‍රික තනතුරු නාමයක් ලෙසින් පවතී. පිරිවෙන් සංවර්ධනය වෙනුවෙන්

කෘත්‍යාධිකාරී හිමිවරුන්ගේ ලැබෙන සහයෝගිතාව පිළිබඳව දිස්ත්‍රික් පිරිවෙන් පරීක්ෂක හිමිවරුන්ගෙන් ලබාගත් තොරුතුරු මගින් හෙළි වන්නේ බොහෝ පිරිවෙන් කෘත්‍යාධිකාරි හිමිවරුන් තම වගකීම හා වගවීම පැහැර හැර කටයුතු කරන බවකි.

එම සාකච්ඡාවන්ගෙන් හඳුනාගත් ගැටලු මෙසේ පෙළ ගස්වා දැක්විය හැකිය.

- භෞතික හා මානව සම්පත් පිළිබඳව නිසි අධීක්ෂණයක් නාවීම.
- රජය පිරිවෙනකින් අපේක්ෂිත අධ්‍යාපන හා සංස්කෘතික තත්වයන් නිසි පරිදි පවත්වාගෙන යාමට උනන්දු නොවීම.
- පිරිවෙන් ආචාර්‍ය්‍ය මණ්ඩලය පත්කිරීමේදී ඇතැම්විට පරිවේණාධිපති හිමියන් නොවිමසා අත්තනෝමතික ලෙස ක්‍රියා කිරීම.
- පිරිවෙන වෙනුවෙන් රජය විසින් වාර්ෂිකව ගෙවනු ලබන මුදල පෞද්ගලික පරිහරණය සඳහා යොදා ගැනීම.
- පිරිවෙන් පාලක සභා, පිරිවෙන් සංවර්ධන අරමුදල් සභා ආදි චක්‍රලේඛ ප්‍රකාර සංගම් නොපිහිටුවීම.
- කෘත්‍යාධිකාරි පරිවේණාධිපති හා පරිවේණාචාර්ය රැස්වීම්වලට සහභාගි නොවීම.
- ශිෂ්‍ය භික්ෂූන් වහන්සේලා වෙනුවෙන් ආගමික හා ආරාමික වතාවත් ඉටු නොකිරීම.
- ප්‍රත්‍ය පහසුකම් සැපයීම, පරිසර සංරක්ෂණය ඉගෙනුම් ඉගැන්වීම් පිළිබඳ අධීක්ෂණයක් නොවීම.
- ඇතැම් කෘත්‍යාධිකාරි හිමිවරුන් විදේශගතවී සිටීම.

ඉහතින් දැක්වූ ගැටලු දෙස අවධානය යොමු කිරීමේදී පැහැදිලිවම දක්නට ලැබෙන්නේ පිරිවෙන් සංවර්ධන ක්‍රියාදාමයේ පදනමින් වර්තමාන ශ්‍රී ලාංකේය පිරිවෙන් අධ්‍යාපන ක්ෂේත්‍රයේ

75% ක් වැනි ප්‍රතිශතයක කෘත්‍යාධිකාරී භූමිකාව අකාර්යක්ෂම වී ඇති ආකාරයයි. පිරිවෙන් අධ්‍යාපන සංවර්ධන ක්‍රියාවලියෙහි තත් අකාර්යක්ෂම වූ කෘත්‍යාධිකාරී භූමිකාව සක්‍රීයව අධ්‍යාපන සංවර්ධන ක්‍රියාදාමය කෙරෙහි නැඹුරුකර ගැනීම උදෙසා යම් ක්‍රියාමාර්ග අනුගත කරගත යුතුය. විහාරස්ථානයේ කෙරෙන කුදු මහත් ආගමික කටයුතු පමණක්ම ඉටුකර ගැනීමට කුල දරුවන් සසුන්ගත කරන ඇතැම් විහාරාධිපති හිමිවරුන්ද තම ශිෂ්‍යයන්ගේ අධ්‍යාපනය පිළිබඳ නොවිසිලිමත් වීම ද මෙවැනි කෘත්‍යාධිකාරී හිමිවරුන්ගේ තත් නිහඬ පිළිවෙතට වක්‍රාකාරව ඉඩ දීමක් කරනු ඇත.

**යෝජනා**

- කෘත්‍යාධිකාරී භූමිකාව අධීක්ෂණයට නතු කිරීම.
- අකාර්යක්ෂම කෘත්‍යාධිකාරීවරුන් වෙනුවෙන් මුදල් ප්‍රතිපාදන වෙන්කිරීමේදී හා ඒවා පරිහරණයේදී වගවෙන කණ්ඩායම් මගින් ඒ පිළිබඳ නිවැරදි දත්ත වාර්තා සුපරීක්ෂණය කිරීම.
- දේශපාලන හෝ යම් යම් බලපෑම් මත කෘත්‍යාධිකාරී හිමිවරුන්ගේ ක්‍රියාකලාපයන් (අත්තනෝමතික) නැවැත්වීම.
- පැහුණු වැඩසටහන් පවත්වා ආකල්පමය සංවර්ධනයක් ඇති කිරීම.
- පිරිවෙන් පාලක සභා, පිරිවෙන් සංවර්ධන අරමුදල් සංගම් පිහිටුවීම.
- කෘත්‍යාධිකාරී හා පරිවේණාධිපති රැස්වීම්වලට සහභාගි වීම අනිවාර්ය කිරීම හා ඒ සඳහා සහභාගි නොවන්නන් වෙනුවෙන් විකල්ප ක්‍රියා මාර්ග තේරීම.
- කෘත්‍යාධිකාරී විදේශගත වන විට ඒ සඳහා ස්ථිර අයෙකු හෝ අනුප්‍රාප්තිකයෙකු හෝ පත් කිරීම.

ඉහතින් දක්වූ යෝජනාවලිය සෑම පිරිවෙනක් වෙනුවෙන්ම ක්‍රියාත්මක කිරීමට පිරිවෙන් පරීක්ෂක මණ්ඩලය ක්‍රියා කළ යුතුය. සෑම පිරිවෙනක් වෙනුවෙන්ම පවතින ''පිරිවෙන් සංවර්ධන කමිටුව'' සක්‍රීය කළ යුතුව ඇත. නමුත් එහි සහභාගීත්වය දරන්නේද කෘත්‍යාධිකාරි හිමියන් බැවින් ඒ පිළිබඳව ගැටලු තත්වයන් මතුව ඇත. ක්‍රමයෙන් විනාශ මුඛයට පත්වෙමින් පවතින සම්බුද්ධ ශාසනය සුරක්ෂිත කර ගැනීමෙහිලා ශිෂ්‍ය භික්ෂූන් වහන්සේලා දැනුම ආකල්ප කුසලතාවන්ගෙන් පිරිපුන් පිරිසක් බවට පත් කිරීම පිරිවෙන් අධ්‍යාපනයට සම්බන්ධ කාගේත් වගකීමක් වන බැවින් ඒ පිළිබඳ දැඩි අවධානය යොමු කළ යුතුය. එහිදී පිරිවෙන් කෘත්‍යාධිකාරි හිමියන්ට පැවරෙන වගකීම හා වගවීම අති විශාලය. තත් කෘත්‍යාධිකාරි භූමිකාව තුළ පවතින චරිත දුර්වලතා හා අකාර්යක්ෂමතාව මග හරවා ගැනීමෙන් සම්බුද්ධ ශාසනයටත්, පිරිවෙන් අධ්‍යාපනයටත් මහගු මෙහෙයක් සිදුවනු ඇත.

## ආන්තික සටහන්


1. ලංකානන්ද හිමි ලබුගම, පිරිවෙන් ශබ්දයාගේ අර්ථ නිරූපණය, *ශාස්ත්‍රීය සංග්‍රහය*, ශ්‍රී ලංකා ප්‍රාචීන භාෂෝපකාර සමාගම, 1990, 03 පිටුව.
2. බුද්ධදත්ත හිමි, පොල්වත්තේ, *පාලි-සිංහල අකාරාදිය*, ඇම්. ඩී. ගුණසේන සහ සමාගම, කොළඹ, 1960, 223 පිටුව.
3. අදිකාරි අබයරත්න, *ශ්‍රී ලංකාවේ සම්භාව්‍ය අධ්‍යාපනය හා මහ සඟන*, ශ්‍රීධර ප්‍රකාශන, රාජගිරිය, 1993, 11පිටුව.
4. *සමන්තපාසාදිකාව*, (සංස්:), වැලිවිටියේ සෝරත හිමි, ත්‍රිපිටක මුද්‍රණාලය, 1926, 06 පිටුව.
5. අදිකාරි අබයරත්න, *ශ්‍රී ලංකාවේ සම්භාව්‍ය අධ්‍යාපනය හා මහ සඟන*, ශ්‍රීධර ප්‍රකාශන, රාජගිරිය,1993, 11 පිටුව.
6. *ශ්‍රී ලංකාවේ ඉතිහාසය II කොටස*, අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව,1997, 98 පිටුව.

7. -එම-, 139 පිට.
8. -එම-, 155 පිට.
9. අදිකාරි අබයරත්න, *ශ්‍රී ලංකාවේ සම්භාව්‍ය අධ්‍යාපනය හා මහ සඟන*, ශ්‍රීධර ප්‍රකාශන, රාජගිරිය,1993, 228 පිටුව.
10. - එම -, 254 පිටුව.
11. අදිකාරි අබයරත්න, *ශ්‍රී ලංකාවේ සම්භාව්‍ය අධ්‍යාපනය හා මහ සඟන*, ශ්‍රීධර ප්‍රකාශන, රාජගිරිය, 1993, 327 පිටුව.
12. *චුල්ලවග්ගපාලි*, වත්තක්ඛන්ධකය, පිටුව 389.


**අශ්‍රිත ග්‍රන්ථ**

**ශබ්ද කෝෂ**

1. බුද්ධදත්ත හිමි පොල්වත්තේ, *පාලි සිංහල අකාරාදිය*, ඇම්. ඩී. ගුණසේන සහ සමාගම, කොළඹ, 1960.

**ප්‍රාථමික මූලාශ්‍ර**

1. *කාව්‍යශේඛරය*, (සංස්:) රත්මලානේ ධර්මාරාම හිමි, විද්‍යාලංකාර මුද්‍රණාලය, 1966.
2. *මහාවංශය*, (සංස්:) ඉලංගසිංහ මංගල, ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ, කොළඹ, 2006.
3. *සංඝරාජ සාධු චරිතය*, (සංස්:) හේන්පිටගෙදර පියනන්ද හිමි, රත්න පොත් ප්‍රකාශකයෝ, 1969.
4. *සමන්තපාසාදිකාව*, (සංස්:) වැලිවිටියේ සෝරත හිමි,ත්‍රිපිටක මුද්‍රණාලය, 1926.

**ද්විතීයියක මූලාශ්‍ර**

1. අදිකාරි අබයරත්න, *ශ්‍රී ලංකාවේ සම්භාව්‍ය අධ්‍යාපනය හා මහා සඟන*, ශ්‍රී ධර ප්‍රකාශන, රාජගිරිය, 1993.

2. අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව, *ශ්‍රී ලංකාවේ ඉතිහාසය I කොටස*, 1997.

3. ජයසේකර යූ. ඩී, *ශ්‍රී ලංකාවේ පැරණි අධ්‍යාපන ඉතිහාසය*, එස්. ගොඩගේ සහ සහෝදරයෝ, 1999.

**පුවත්පත් හා සඟරා**

1. *දිවයින*, ලේක් හවුස් මුද්‍රණාලය, 2011/11/24.

2. සෝභිත හිමි මාදුළුවාවේ, සෝරත හිමි කඹුරුගොඩ, *භික්ෂුව හා ලංකා සමාජය*, සිස්ටමැටික් ප්‍රින්ට් ප්‍රයිවට් ලිමිටඩ්, දෙහිවල, 1997.

3. සෝමානන්ද හිමි අමුගොඩ, *සද්ධර්මාකර*, කරපුටුගල රේවත හිමි, ශ්‍රී ලංකා ජාතික පුස්තකාල මණ්ඩලය. 2000.

4. *සම්භාෂා, 4 කලාපය*, අධ්‍යාපන හා උසස් අධ්‍යාපන අමාත්‍යංශය, 1992.

5. *සම්භාෂා, 10 කලාපය*, අධ්‍යාපන හා උසස් අධ්‍යාපන අමාත්‍යංශය, 1999.

6. *ශාස්ත්‍රීය සංග්‍රහය*, ශ්‍රී ලංකා ප්‍රචීන භාෂෝපකාර සමාගම, 2004.

(සම්මුඛ සාකච්ඡා මගින් දත්ත ලබා ගැනීමේදි දිස්ත්‍රික් පිරිවෙන් පරීක්ෂක හිමිවරුන් කීපනමක්, පරිවේණාධිපතිවරු කීපනමක්, නියෝජ්‍ය පරිවේණාධිපතිවරු කීපනමක්, විශ්වවිද්‍යාලයීය ශිෂ්‍ය භික්ෂූන් වහන්සේලා කීපනමක් හා පිරිවෙන් කීපයක ගිහි ගුරුවරුන් කීපදෙනෙක්, පිරිවෙන් ශිෂ්‍ය සංගම්වල සභාපති/ලේකම් වරුන් කීපදෙනෙකු හා දායක සභා කිහිපයක සභාපති (ගිහි) ලේකම්වරු කීපදෙනෙකු සහයෝගය දක්වන ලද අතර ඔවුන්ගේ පෞද්ගලික නාම හෝ ස්ථාන නාම සඳහන් කිරීම ප්‍රතික්ෂේප වී ඇත.)